# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/43 - 2014 මැයි මස 09 වැනි සිකුරාදා - 2014.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස විසල් අනුරාධපුර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මිහින්තලය නගර සංවර්ධනය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 මැයි මස 07 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03 හි,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 574 කුලන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කුලන්කුලම ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 248 හා 1982.09.30 දින දරන සැලැස්මේ කැබලි අංක 40 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 20.327 (අක්. 50, රූඩ් 0, පර්. 34.24) ක විශාලත්වයෙන් යුත් පහත සඳහන් මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| උතුරට | ඃ | අ. භූ. පි. 248හි කැබලි අංක 41 ; |
| නැගෙනහිරට | ඃ | අ. භූ. පි. 248හි කැබලි අංක 41 ; |
| දකුණට | ඃ | ඉච්චන්කුලම අ. භූ. පි. 255 හා අ. භූ. පි. 248හි කැබලි අංක 41 ; |
| බටහිරට | ඃ | අ. භූ. පි. 248හි කැබලි අංක 41 ; |

05-750

1A - G 19546— 65 (2014/05)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.